Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# දෙවන වාර පරීක්ෂණය 2019

# නර්තනය

**8 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

නම/ විභාග අංකයඃ

## I - කොටස

- **සියලුම ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුරු සපයන්න.**
- **අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01 විනෝදාස්වාදය සඳහා භාවිත ගැමි නැටුම් වේ.

(1) ලී සහ කුළු (2) කල සහ ගොයම් (3) ගොයම් සහ කුළු (4) පතුරු සහ සවරම්

02 තෙයියත් /// තාම්, තේයි තාම්, තෙයි තෙයි තත් තත් තාම්
යන පද කොටසට අයත් වන්නේ,

(1) දැල අඩියයි. (2) සිව් අඩියයි. (3) තුන් අඩියයි. (4) හමාර පදයයි.

03 ''තත්, ජිත්, තොන්, නන්'' යන බෙර අක්ෂර වූ කලී

(1) ගර්භාක්ෂර වේ. (2) ස්වරාක්ෂර වේ. (3) බීජාක්ෂර වේ. (4) ව්‍යංජනාක්ෂර වේ.

04 ''ජිං තරි කිට ජිං රුකුතක'' යන අලංකාර බෙර පදය අයත් වන්නේ,

(1) මාත්‍රා $2 + 2$ තාල රූපයට ය. (2) මාත්‍රා $4 + 4$ තාල රූපයට ය.

(3) මාත්‍රා $3 + 3$ තාල රූපයට ය. (4) මාත්‍රා $2 + 3$ තාල රූපයට ය.

05 ''ඉසුරු දෙවිඳු වඩින දිනා.....'' යන කවියේ දෙවන පාදය වන්නේ,

(1) කෙහෙතු විමන දක නෙතිනා (2) විමන සමග කෙහෙතු දූනා

(3) එම විමනා දෙවි වඩිනා (4) ඉසුරු දෙවිඳු තුති දෙමිනා

- **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල දී ඇති පදවල නොගැලපෙන වචනය තෝරා යටින් ඉරක් අඳින්න.**

06 (1) දුර්ගා (2) සරස්වතී (3) ලක්ෂ්මී (4) පත්තිනි (5) පාර්වතී

07 (1) කස්තිරම (2) කලාසම (3) බෙරපදය (4) සීරුමාරුව (5) අඩව්ව

08 (1) සමගුණ (2) දෙගුණ (3) තුන්ගුණ (4) යහගුණ (5) සිව්ගුණ

09 (1) පතුරු (2) වන්නම් (3) සවරම් (4) තාලම් (5) ගොයම්

10 (1) විභාග (2) සංකේත (3) ආවර්ත (4) මාත්‍රා (5) බෙරපද

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට අදාළ පිළිතුරු මගින් ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.**

<u>පහළට</u>

11 දුර්ගා දෙවි සත්‍යයට හා ................................ ට අධිපති දේවතාවියයි.


12 රූපයෙන් නෙලා ඇති නර්තන ශිල්පින් මෙනමින් හැඳින්වේ.

13 පෙරහැර අලංකාර කරන ගැමි නැටුමකි.

<u>හරහට</u>

14 සුසිර සංඝයට අයත් වාද්‍ය භාණ්ඩයකි.

15 රූපයෙන් කළ කර්මාන්ත මෙනමින් හැඳින්වේ.



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට අදාළ පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

(වෛරොඩි / තුරඟා / දෙවොල් / පහතරට / සූරිය)

16 ........................................ දෙවි පතුරු සවරං යන ගැමි නැටුම්වල පුද ලබයි.

17 ........................................ බෙරය මගින් ගැඹුරු හඬක් නිපදවීමට හරක් සිවිය භාවිත කරයි.

18 ''කුද ගජිත කුද තා'' කස්තිරම ..................................... වන්නමේ භාවිත වේ.

19 ..................................... වන්නම 3 + 3 තාල රූපයට අයත් වේ.

20 ........................................ දෙවි දෙවොල්මඩු ශාන්තිකර්මයේ පුද ලබයි.

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

01 (1) නර්තන සම්ප්‍රදායන්හි තාල තැබීම සඳහා ............................................ භාවිතා කරයි.

(2) නවරාත්‍රී උත්සවයේ 10 වන දිනයේ පූජාව ..................................... නමින් හැඳින්වේ.

(3) ලීය දෙපස අලංකාර රැළි අලවා සකස් කරගන්නා රංග උපකරණය ........................ නමින් හැඳින්වේ.

(4) ............................................. බෙර පදය ගොඩ සරඹ නැටීමේ දී භාවිතා කරයි.

(5) කතුවරයෙක් රහිත ගීත ............................................ නමින් හැඳින්වේ. (ල. 2 x 5 = 10)

02 ප්‍රායෝගිකව භාවිත නර්තනය ලිඛිතව දැක්වීමේ දී ප්‍රස්තාරකරණය වැදගත් වේ.

(1) ගොඩ සරඹ බෙර පදය දෙගුණ ලයට (මධ්‍යලයට) ප්‍රස්තාර කරන්න. (ල. 03)

(2) තුරඟා වන්නමේ සීරුමාරුව ප්‍රස්තාර කරන්න. (ල. 03)

(3) ''සූරිය කුළ ඇති හිරු දෙවියන්නේ'' යන කවිය නියමිත තිත් රූපයට ප්‍රස්තාර කරන්න. (ල. 04)

03 ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අයත් ශාන්තිකර්මය ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| (1) ශාන්තිකර්මය | (2) පැවැත්වීමේ හේතු | (3) චාරිත්‍ර විධි | (4) නර්තන අංග | (5) පුදලබන දෙවිවරු |
|---|---|---|---|---|
| | 1. ............................. | 1. ............................. | 1. ............................. | 1. ............................. |
| | 2. ............................. | 2. ............................. | 2. ............................. | 2. ............................. |

(ල. 2 x 5 = 10)

04 විවිධ ජන වර්ග හා සබැඳි සංස්කෘතික උත්සව මගින් ජාතික සමගිය තහවුරු කරයි.

(i) නවරාත්‍රී උත්සවය පැවැත්වීමේ අරමුණ ලියන්න. (ල. 02)

(ii) එහි පුද ලබන දෙවිවරු නම්කර ආගමික පසුබිම හඳුන්වන්න. (ල. 04)

(iii) එහි චාරිත්‍ර දෙකක් නම් කර සැරසිලි දෙකක් නම් කරන්න. (ල. 04)

05 දේශීය නර්තන කලාවේ උන්නතියට ''රූකම්'' මනා පිටුවහලක් සපයයි.

(i) ගම්පොල යුගයේ දුව මගින් ඉදිකළ ආගමික මධ්‍යස්ථානයක් නම් කරන්න. (ල. 02)

(ii) රූකම්වල ප්‍රභේද නම්කොට ඒවා දැකිය හැකි ස්ථාන නම් කරන්න. (ල. 04)

(iii) රූකම් ආරක්ෂා කර ගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න. (ල. 04)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01 | 4 | 06 | පත්තිනි (3) | 11 | බලය | 16 | සූරිය |
| 02 | 4 | 07 | බෙර පදය (3) | 12 | නළු රූ | 17 | පහතරට |
| 03 | 3 | 08 | යහගුණ (4) | 13 | සවරම් | 18 | තුරඟා |
| 04 | 3 | 09 | වන්නම් (2) | 14 | බටනලාව | 19 | වෛරොඩි |
| 05 | 1 | 10 | (බෙරපද (5) | 15 | රූකම් | 20 | දෙවොල් |

(1 x 20 = 20)

## II කොටස

01 (1) තාලම්පට (2) විජයදසම් (3) සවරම් (4) දොම්කිත කිතදොම් (5) ගැමි ගී

02 (i)

| 1́ | 2 | 3 | 4 | 1́ | 2 | 3 | 4 | 1́ | 2 | 3 | 4 | 1́ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දොම් | කිට | කිට | දොම් | දොම් | කිට | කිට | දොම් | දොම් | කිට | කිට | දොම් | දොම් | කිට | කිට | දොම් |

(ii)

| 1̂ | 2 | 1́ | 2 | 3 | 1̂ | 2 | 1́ | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|
| කු | ද | ග | ජී |ත | ග |ත | දොං | - | ත |
| ගත් | - | ජිත් | - | ග | ජිං | - | ජී | කු | ද |
| කු | ද | ග | ජී | ත | ග | ත | දොං | - | ත |
| දො | - | තා | | | | | | | |

(iii)

| 1́ | 2 | 3 | 4 | 1́ | 2 | 3 | 4 | 1́ | 2 | 3 | 4 | 1́ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | සු | රි | ය | කු | ල | ඇ | කි | හි | රු | දෙ | වි | ය | න් | නේ | - |
| + | පෑ | වි | ය | අ | ණ | ස | ක | ලො | ව | ප | ව | ති | න් | නේ | - |
| + | කා | රි | ය | ක | ර | වා | - | ප | හ | දා | - | දෙ | න් | නේ | - |
| + | පතු | රු | නැ | ට් | - | ම | ට | අ | ව | ස | ර | දෙ | න් | නේ | - |

03 (1) * කොහොඹාකංකාරිය * පර්යේෂණ කටයුතු සඳහා

(2) * ලෙඩරෝග නිවාරණය * සංරක්ෂණය කර ගැනීමට

* සශ්‍රීකත්වය

* සෙත් ශාන්තිය ලබාගැනීම සඳහා

(3) * කප් සිටුවීම / මඩුපේ කිරීම / තොටපේ කිරීම / මලපේ කිරීම

(4) යක් ඇන්දුම / ආවැන්දුම / අස්නේ / කොහොඹා හැල්ල / හත්පදය

(5) කොහොඹා දෙවි තුන් කට්ටුව / බණ්ඩාර දෙවිවරු / ඉරුගල් බණ්ඩාර / කන්දේ බණ්ඩාර

04 (i) දෙවියන් පිදීම / සශ්‍රීකත්වය, සෞභාග්‍ය ප්‍රාර්ථනා කිරීම / අධ්‍යාපන කටයුතු ආරම්භ කිරීම

(ii) දුර්ගා දේවිය / ලක්ෂ්මී දේවිය / සරස්වතී දේවිය (ආගමික පසුබිම විස්තර කර ඇත්නම්)

(iii) පළමු දින 03 දුර්ගා දේවියට පූජා පැවැත්වීම.

ඊළඟ දින 03 ලක්ෂ්මී දේවියට පූජා පැවැත්වීම.

අවසාන දින 03 සරස්වතී දේවියට පූජා පැවැත්වීම.

10 වන දිනයේ විජය දසම් පූජාව පැවැත්වීම

සැරසිලි: * හින්දු කෝවිල් සැරසීම.

* කෙසෙල් කැන් කෙසෙල් ගස් භාවිතා කර සැරසිලි සකස් කිරීම.

* තට්ටු නවයකින් යුත් ආසනයක් සකස් කර දේව රූප, සෙල්ලම් බඩු, ධාන්‍ය ඇට සහ පැල වර්ග වලින් තබා අලංකාර කිරීම.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**8 ශ්‍රේණිය** | **දෙවන වාර පරීක්ෂණය 2019** | **නර්තනය**

**පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස**

05 (i) ඇම්බැක්කේ දේවාලය

(ii) රූකම්

| ගල් කැටයම් | ලී කැටයම් | සිතුවම් | මූර්ති |
|---|---|---|---|
| ගඩලාදෙණිය | ඇම්බැක්කේ | සීගිරිය | මිහින්තලේ |
| බෙන්තර ගලපාත විහාරය | | මුල්කිරිගල | අනුරාධපුර |
| යාපහුව මාළිගය | | පොල්වත්ත පන්සල | කුට්ටම්පොකුණ |
| | | | දැදිගම කොටවෙහෙර |
| | | | පොළොන්නරුව අංක 2 |
| | | | ශිව දේවාලය |

(iii) ආරක්ෂා කර ගැනීම සඳහා ලියා ඇති ඕනෑම යෝජනාවකට ලකුණු ලබාදෙන්න.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# දෙවන වාර පරීක්ෂණය 2019

**8 ශ්‍රේණිය**

# නර්තනය

## ප්‍රායෝගික පරීක්ෂණය

01 (i) කැමති ගායනය (ලකුණු 05)

(ii) ගුරුවරයා විසින් නම්කරන ලද ගායනය (ගුරුවරයාගේ අභිමතය පරිදි) (ලකුණු 05)

02 (i) 4 - 6 දක්වා ගොඩ සරඹයක් කස්තිරම සමග (ගුරුවරයාගේ අභිමතය පරිදි) (ලකුණු 10)

03 තුරඟා වන්නමට අදාළ අලංකාර මාත්‍රයක්, කස්තිරම සමග (ලකුණු 10)

04 පතුරු හෝ සවරං ගැමි නැටුම් වලින් එකක් එක් කවියකට (ලකුණු 10)

05 පහත සඳහන් චරිත වලින් කැමති චරිතයක් නර්තනය නිර්මාණයෙන් ඉදිරිපත් කරන්න. (ලකුණු 10)
(අලියා / සිංහයා / මොනරා / උකුස්සා)

(මුළු ලකුණු 10 x 5 = 50)